# පුනරාවලෝකන
# 2022-2023

දෑ වසරක රිච්මන්ඩ් තතු හද තුටින් රිච්මන්ඩ් ප්‍රජාව
වෙත අනාවරණය කෙරෙන වගයි

රිච්මන්ඩ් විද්‍යාලය
2024.01.24



# විදුහල්පති සටහන

මින් හරියට ම වසර දෙකකට පෙර රිච්මන්ඩ් කඳු මුදුනෙහි විරාජමානව බැබලෙන මේ උතුම් පින් බිමට මා පා තැබුවේ එහි නියමුවන් ලෙස එය තවත් බබලවන්නට ය. රිච්මන්ඩ්වරයකු වූ මා මිතුරු නිලූක වීරසිංහයන් එම භාරදූර කාර්යය මා වෙත පවරමින් මෙම පින්බිමෙන් නික්ම ගියේ ඔහු උගත් පාසලට මම ද උපරිම සේවයක් සිදු කරනු ඇතැයි අදිටනින් වනු නොඅනුමානය.

ඒ වන විට ද අධ්‍යාපන ක්ෂේත්‍රයේ වසර 13ක අත්දැකීම් සහ රාජ්‍ය සේවයේ වසර 23ක අත්දැකීම් සහිත ව සිටි මා විදුහල්පති භූමිකාවට ආධුනිකයකු වූව ද එම වගකීම භාර ගත්තේ මා නිර්දේශ කරන ලද අධ්‍යාපන නියමුවන් සහ මාගේ පත්වීම් බලධාරියා මා කෙරෙහි දක්වන ලද ඉහළ විශ්වාසය එලෙසින් ම සුරකිමින් පාසල් දැක්ම සහ මාගේ ප්‍රතිපත්ති මත රඳමින් විදුහල්පති භූමිකාව නිසි පරිදි ඉටු කිරීමේ තිර අදිටනිනි.

ඉතා ක්‍රියකාරී පාසලක් වන රිච්මන්ඩ් විදු පියස වසරක් තුල ඉහළ ප්‍රතිඵල වලින් යුතු මානව නිෂ්පාදනයක් සමාජගත කරන සාම්ප්‍රදායික යාන්ත්‍රණයක ක්‍රියාත්මක වන දැවැන්ත ආයතනයක ක්‍රියාදාමයෙන් මදක් විතැන් ව දරුවන්ට වඩා ප්‍රියජනක, විධිමත්, අවිධිමත් සහ සැඟවුනු විෂයය මාලාව මනා ලෙස සම්මිශ්‍රණයව ක්‍රියාත්මක වන සජීව සහ නවතාවයෙන් යුතු පාසලක් බවට පත් කිරීම මාගේ සිහිනයයි.

විදුහල්පති භූමිකාව තුළ ජනප්‍රිය තීරණ ගැනුම වෙනුවට සැමවිට ම නිවැරදි තීරණ ගැනුම ට පසුගිය දෙවසර තුළ මා නිරන්තරයෙන් උත්සාහ කරන ලද අතර ඉහළ මූල්‍ය විනයක් සහ විනිවිදභාවයකින් යුතු පරිපාලන හා කළමනාකරණ රාමුවක් තුළ සියලු ක්‍රියාකාරකම් නීත්‍යානුකූලව ඉටුකිරීම මාගේ පරම අභිලාෂය විය.

මා නියමුවාණන් ලෙස කටයුතු කරන කාලය තුළ මේ උතුම් පිං බිමෙන් බාහිර සමාජයට නික්ම යන සැම රිච්මන්ඩ් පුතකු ම දැඩි සීමා බන්ධනයන්ගෙන් කෘතිම ලෙස පාලනය කරන ලද තාවකාලික වූ විනයකින් හෙබි අයකු නොව රිච්මන්ඩ් මාතාවට ඉහළ බුහුමනක් ගෙනෙන පරිදි ස්වයං ව සකසා ගත් විනයක් සතු අයකු ම විය යුතු බවත් සහකම්පනයෙන් සහ සහනශීලීත්වයෙන් කටයුතු කරන බුද්ධිමකතු විය යුතු බවත් සමස්ථ සමාජයම ඒකාලෝක කරන්නට සමත් කමක් සහිත වියතෙකු වීමේ මූලික සුදුසුකම් සපුරාලූවකු විය යුතු බවත් නිරෝගී සම්පන්න පිරිපුන් පෞරුෂයක් ගොඩනගා ගත් ශක්තිමත් ආචාරශීලී යෞවනයකු විය යුතු බවත් අදහස් කරමි.

පසුගිය දෙවසර තුළ සාර්ථක ව නිම කෙරුනු කාර්යයන් සහ මාගේ රිච්මන්ඩ් පුතනුවරුන් ලබාගත් ඉහළ ජයග්‍රහණයන් පිළිබඳ ආවර්ජනයෙන් ලබන ඉහළ රැකියා තෘප්තියකින් සහ නිබඳ ව යෝධ සවියක් වෙමින් මා සමග ම සිටි විද්‍යාලයීය ඉහළ කළමනාකාරීත්ව මණ්ඩළය, කළමනාකරණ කණ්ඩායම, අධ්‍යයන අනධ්‍යයන කාර්යය මණ්ඩළය, පාසල් සංවර්ධන සමිති සහ ආදි ශිෂ්‍ය සංගම් විධායක කමිටු සාමාජිකයින්, දෙමාපියන්, ආදි ශිෂ්‍යයන්, ශිෂ්‍යනායක මණ්ඩළය ඇතුළු සමස්ථ ශිෂ්‍යයින් වෙත මාගේ කෘතවේදීත්වය පළ කරමින් රිච්මන්ඩ් මුල් පුටුව හොබවනු ලබන තෙවන වසර අද දිනෙන් අරඹමි.



පී.එස්.පුෂ්පකුමාර
විදුහල්පති
රිච්මන්ඩ් විද්‍යාලය
2024.01.24

# පුනරාවලෝකන 2022 – 2023

මෙහි පහත සටහන් මගින් සාමාන්‍යයෙන් පාසල තුළ ක්‍රියාත්මක වූ පරිපාලන, අධ්‍යාපන සංවර්ධන, ක්‍රීඩා සහ විෂයය සමගාමී කටයුතු හැරුණු කොට ප්‍රජාව දැනුවත්වීම සුදුසු බව ට ම විසින් හඳුනාගත් 2022, 2023 වර්ෂවල ඉහත අංශයන්හි සිදු කරන ලද වෙනස්කම් සහ එම දැවුරුදු කාලසීමාව තුළ විද්‍යාලයීය මාධ්‍ය ඒකකය හරහා පාසලේ අභ්‍යන්තර ප්‍රජාව දැනුවත් කෙරුණු සිසුන් විසින් අත්පත් කරගත් ක්‍රීඩා සහ විෂයය සමගාමී ජයග්‍රහණ පිළිබඳ තොරතුරු ඔබ වෙත ගෙන හැරේ.

## පාසල් පරිපාලන සහ කළමනාකරණ අංශය

### ඉහළ කළමනාකාරීත්වයේ සාධනීය වෙනසක් ...

2022 වර්ෂය පරිපාලනමය හා කළමනාකරණ විෂයය පථයෙහි විශාල වෙනස්කම් සිදුකළ වර්ෂයක් විය. ඒ අනුව අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ ප්‍රකාර ව පාසලේ ඉහළ කළමනාකරණ ව්‍යුහය පහත පරිදි වෙනස් කිරීම සිදුකෙරිනි.

1. නියෝජ්‍ය විදුහල්පති (පාලන)
2. නියෝජ්‍ය විදුහල්පති (අධ්‍යාපන සංවර්ධන)
3. නියෝජ්‍ය විදුහල්පති (ක්‍රීඩා සහ විෂය සමගාමී)
   (ඉහත නියෝජ්‍ය විදුහල්පති තනතුරු අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පත්කරනු ලැබූ නියෝජ්‍ය විදුහල්පතිවරුන් තිදෙනෙකු වෙත ප්‍රදානය කරන ලදී)
4. සහකාර විදුහල්පති (ප්‍රාථමික අංශය)
5. සහකාර විදුහල්පති (6-11 අංශය)
6. සහකාර විදුහල්පති (උසස් පෙළ අංශය)
7. සහකාර විදුහල්පති (භෞතික සම්පත්)

### පාසලට සිසුන් බඳවා ගැනීමේ ක්‍රියාවලියේ සාධනීය වෙනසක් ...

2022 සහ 2023 වර්ෂවලට අදාළ ව පවත්වන ලද පළමු ශ්‍රේණියට සිසුන් බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ, 6 ශ්‍රේණියට සිසුන් බඳවා ගැනීම සහ අ.පො.ස (උ.පෙළ) සඳහා සිසුන් බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ ඉතා සාර්ථක ව සහ විනිවිදභාවයකින් යුක්ත ව සිදු කරන ලදී.

පළමු ශ්‍රේණියට සිසුන් බඳවා ගැනීමේ ක්‍රියාවලියේ දී පදිංචි ස්ථානය හඳුනා ගැනීම සඳහා GPS පාඨාංක පාදක කර ගැනීම, පාසලට ආසන්නතාවය සඳහා ලකුණු ලබා දීමේ දී එතෙක් භාවිත කළ Scribble Map භාවිතය වඩාත් විනිවිද භාවයකින් යුක්තව සිදු කිරීම සඳහා සියලු ම අයදුම්කරුවන්ට පෙනෙන පරිදි නිවාස වල ස්ථානීය පිහිටුම බහු ප්‍රක්ෂේපණ පහසුකම් භාවිතයෙන් දර්ශනය කිරීමත් සෑම අයදුම්කරුවකු විසින් එම අවස්ථාවේදී ම ලබාගත් මුද්‍රිත පිටපතක් භාවිතයෙන් පමණක් ආසන්නතාවය සඳහා ලකුණු දීමත් සිදු විය.

තව ද ආදි ශිෂ්‍ය ගණය හැර බඳවා ගැනීම සිදු කරනු ලබන සෙසු සියලුම ගණ සඳහා ස්ථානීය පරීක්ෂණ සිදුකළ අතර ස්ථානීය පරීක්ෂණයන්ගෙන් අසමත්වූවන් ලබාඇති ලකුණු මත නොයැපී තාවකාලික ලේඛනයෙන් ඉවත් කොට සැබෑ ලෙස පදිංචි බව තහවුරු වූ අයදුම්කරුවන්ට එම අවස්ථාව සලසා දුනි.

සියලු ම නිවාස වල ඉදිරිපස පෙනෙන ලෙස ලබාගත් ඡායාරූපයක් අයදුම්කරුවන් වෙතින් ගෙන්වා ගැනීමත් නිවාස පරීක්ෂාව සඳහා දෙදෙනෙකුගෙන් සමන්විත කුඩා කණ්ඩායම් යොමු කිරීමත් එක් කණ්ඩායමක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සාමාජිකයකු සහ පාසලේ ඉහළ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයකුගෙන් සැදුම්ලන පරිදි ඉතා රහස්‍ය ලෙස සැකසීමත් එම කුඩා කණ්ඩායම වෙත නිවාස පරීක්ෂාව සිදුකිරීමට නියමිත ස්ථාන පිළිබඳ ඉතා කෙටි දැනුම්දීමකින් යුතු ව සිදු කිරීමත් ඒ සඳහා mini WhatsApp සමූහ භාවිත කිරීමත් නිවාස පරිකෂාව සමත් අසමත් බව අදාළ ස්ථානයේ සිට ඒ මොහොතේ ම සන්නිවේදනය කෙරෙන පරිදි Google Form භාවිතය හඳුන්වා දීමත් ක්‍රියාත්මක කිරීමත් සිදු කෙරිනි.

සම්මුඛ පරීක්ෂණ විෂයයට අදාළ කටයුතු සිදුකිරීම සඳහා එකම විෂයය භාර නිලධාරියකු දීර්ඝ කාලයක් යොදවා ගැනීම වෙනුවට වර්ෂයක් පාසා එම භාරකාරීත්වය වෙනස් කිරීම සිදුවිය.

උසස් පෙළ සඳහා බාහිර සිසුන් බඳවා ගැනීම අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ ප්‍රකාර ව එහි වූ ලකුණු දීමේ පටිපාටියට අනුව ම සිදු කිරීම අරඹන ලද අතර සම්මුඛ පරීක්ෂණ පවත්වනු ලබන දින ම එහි ප්‍රතිඵල නිවේදනය ද සිදු කෙරිනි.

අමතර පංති සඳහා සිසුන් බඳවා ගැනීම අධ්‍යාපන චක්‍රලේඛ උපදෙස් පරිදි පමණක් සිදු කෙරිනි.

මෙම සෑම බඳවා ගැනීමකදී ම අධ්‍යාපන අමාත්‍යාංශ මගින් අනුමත ගාස්තු පමණක් අයකිරීම සිදු කෙරිනි.

## විදුහල්පති කාර්යය මණ්ඩලය

විදුහල්පති කාර්යය මණ්ඩලය එක් කළමනාකරණ සහකරුවකුට, එක් කාර්යාල සේවකයකුට සහ නිල රියදුරුට පමණක් සීමා කරන ලදී.

## විද්‍යාලයීය වෑන් රථය

විද්‍යාලයීය වෑන් රථය නිල රාජකාරී ගමන් බිමන් සඳහා පමණක් යොදවා ගැනිනි.

## ආපන ශාලාව

අධ්‍යාපන චක්‍රලේඛ අනුව යළි අරඹන ලද අතර කොවිඩ් සමයට පෙර ටෙන්ඩර් ලබා දී තිබූ දෛනික ගාස්තු අයකිරීමේ පදනමින් විතැන්ව මාස්පතා අයකරනු ලබන කොන්දේසි ඇතුළත් විදුලි ගාස්තු වෙනම විදුලි මීටරයක් ඔස්සේ අය කෙරෙන ක්‍රමවේදයකට යළි අරඹන ලදී.

## වාර්ෂික මහා ත්‍යාග ප්‍රදානොත්සවය

සමස්ථ දිවයින ම දැඩි ආර්ථික සහ සාමාජයීය අභියෝග රැසකට මුහුණ දී ඇති වටපිටාවක එකම වර්ෂයක් තුළ (2023 ජනවාරි සහ දෙසැම්බර් මාසවල) වසර 4ක ඇගයීම් ඉතා සාර්ථක ව සිදු කිරීමට හැකිවීමත් රිච්මන්ඩ් විද්‍යාලයීය පළමු වාර්ෂික මහා ත්‍යාග ප්‍රදානෝත්සවය පවත්වන ලද දිනය වන දෙසැම්බර් මස 20වැනි දින ම (බදාදා දවසකි) 2020, 2021 සහ 2022 වර්ෂ වලට අදාළ කණිෂ්ඨ සහ ජ්‍යෙෂ්ඨ ත්‍යාග ප්‍රදානෝත්සව 6ක් පෙ.ව. 8.00 සිට දහවල් 12.00 දක්වා සහ ප.ව. 3.00 සිට ප.ව. 9.00 දක්වා අති සාර්ථකව නිම කිරීමට හැකිවීමත් සුවිශේෂ වේ. එමගින් වත්මන් රිච්මන්ඩ් අධ්‍යයන අනධ්‍යයන කාර්යය මණ්ඩලය සහ සිසුන් "කළ නොහැක්කක් නොමැත" යන්න මොනවට තහවුරු කරන ලදී. මෙහිලා ප්‍රධාන ආරාධිත අමුත්තන්, දෙමාපිය, ආදි ශිෂ්‍ය සහ සුභපතන්නන් වෙතින් ලද සහාය ද අතිමහත් ය. පූර්ව සංවිධාන කටයුතුවල දී තාක්ෂණික මෙවලම් නිසිපරිදි යොදාගැනීම මෙම සාර්ථකත්වයට මහත් රුකුලක් විය.

## ප්‍රථම විද්‍යුත් ආරාධනාපත්‍රය සහ ප්‍රථම විද්‍යුත් සමරු කලාපය

රිච්මන්ඩ් ඉතිහාසයේ වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවයක් සඳහා නිර්මාණය කරන ලද ප්‍රථම විද්‍යුත් ආරාධනාපත්‍රය සහ ප්‍රථම විද්‍යුත් සමරු කලාපය ද 2023.12.20 දින පැවති 147වන 148වන සහ 149 වන වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවවල දී භාවිතය සහ එළිදැක්වීම සුවිශේෂී වේ. එය විද්‍යාලයීය මට්ටමින් සිදුකරන ලද ප්‍රථම විද්‍යුත් භාවිතාව ද වේ. ඒ අනුව මෙතෙක් ත්‍යාග ප්‍රදානෝත්සවයට සහභාගී වී විදුහල්පති වාර්තාව ශ්‍රවණයෙන් හෝ එම වාර්තාවේ මුද්‍රණය කරන ලද සීමිත පිටපත් කියවීමෙන් අදාළ කාලය තුළ පාසලේ කටයුතු පිළිබඳ දැනගැනීමට තිබූ සීමිත අවකාශය අසීමිත ලෙස පුළුල්වීම සිදු විය. විද්‍යාලයීය නතු ප්‍රජාව වෙත මුදා හැරෙන ප්‍රබල මාධ්‍යක් නිර්මාණයවීම ද එමගින් විද්‍යාලය ට ඇති වූ අතිශය හිතකර බලපෑමකි. තව ද නව තාක්ෂණික යුගයක කාලෝචිත සංකල්ප ඔස්සේ ආරාධනාපත්‍ර සහ සමරුකලාප සඳහා යන වියදම සම්පූර්ණයෙන් ම ශුන්‍ය කිරීම හරහා ඉතා විශාල මූල්‍යාම ය වාසියක් අත්පත්කර ගැනීමට ද පාසල් පරිපාලනය සමත් විය.

# අධ්‍යාපන සංවර්ධන අංශය

## ජාතික මට්ටමේ විභාග ප්‍රතිඵල

2022 අධ්‍යයන වර්ෂය ජාතික මට්ටමින් ඉහළම ජයග්‍රහණ රැසක් හිමිකරගත් වර්ෂයක් විය. 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය, අ.පො.ස (සා.පෙළ) විභාගය සහ අ.පො.ස (උ.පෙළ) විභාගය යන සියළුම ජාතික විභාග ප්‍රතිඵල පූර්ව වර්ෂවලට සාපේක්ෂව ඉහළ මට්ටමක පැවතීම සතුටට කරුණකි. ඒ අතරින් 2022 අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී ඉංජිනේරු තාක්ෂණවේදය විෂයය ධාරාවෙන් සමස්ථ දිවයිනේ ම ප්‍රථම ස්ථානය සහ සිව්වන ස්ථානය ද ජෛව විද්‍යා විෂයය ධාරාවෙන් සමස්ථ දිවයිනේ සිව්වන ස්ථානය ද, භෞතීය විද්‍යා විෂයය ධාරාවෙන් සමස්ථ දිවයිනේ අටවන ස්ථානය ද හිමිකර ගනිමින් සමස්ථ දිවයිනේ ඉහළ ම දසදෙනා අතරට එක්වීමට රිච්මන්ඩ් පුතුන් සිව්දෙනෙකු ම දෙනෙකු ම සමත්වීම සුවිශේෂ වේ.

මෙතෙක් 2023 වර්ෂයට අදාළව 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය පමණක් පවත්වා ඇති අතර එම ප්‍රතිඵලය 2022 වර්ෂය අභිබවා ඇත.

## උසස් පෙළ වාර විභාග ඇගයීම

උසස් පෙළ අංශයේ වාර විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේ දී එතෙක් භාවිත කරන ලද සාමාන්‍ය ඉංග්‍රීසි ලකුණ ද ඇතුළත් ව මුළු ලකුණු පදනම් ව සිසුන් තරා කිරීම (Rank) වෙනුවට අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී භාවිත කරන නිර්ණායක මත පදනම් ව Z අගය ගණනය කොට සිසුන් වෙත ප්‍රතිඵල නිකුත් කිරීමත් ඒ අනුව තරා කිරීමත් හඳුන්වාදෙනු ලැබිණි. එමගින් සිසුන්ට සිය විෂයය ධාරාවෙන් පාසල තුළ තමා සිටින ස්ථානය පිළිබඳ අවබෝධ කර ගැනීමට හැකි වූ වා සේ ම එය සිසු සාධනය ඉහළ යාමට ද එය හේතු විය.

ඒ එක් එක් පංතියේ ඉහළ ම මුළු ලකුණු ලබාගත් 5 දෙනාගෙන් විතැන්ව භෞතීය විද්‍යා විෂයය ධාරාවෙන් ඉහළම Z ලකුණ හිමි කර ගත් සිසුන් 20 දෙනාට ද ජෛවීය විද්‍යා විෂයය ධාරාවෙන් ඉහළම Z ලකුණ හිමි කර ගත් සිසුන් 10 දෙනාට ද වාණිජ විෂයය ධාරාවෙන් ඉහළම Z ලකුණ හිමි කර ගත් සිසුන් 10 දෙනාට ද ඉංජිනේරු තාක්ෂවේදය විෂයය ධාරාවෙන් ඉහළම Z ලකුණ හිමි කර ගත් සිසුන් 10 දෙනාට ද කලා විෂයය ධාරාවෙන් ඉහළම Z ලකුණ හිමි කර ගත් සිසුන් 5 දෙනාට ද විදුහල්පති අතින් ප්‍රගති වාර්තාව ලබාදීම සිදු කෙරුනි.

තව ද සංයුක්ත ගණිතය, භෞතීය විද්‍යාව සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය සංයෝජනය ඉගෙනුම ලබන සිසුන් සඳහා වෙනම පංතියක් වෙන්කිරීමට ද කටයුතු කෙරිනි. මෙය ඉහළ සිසු ඉල්ලුම සැලකිල්ලට ගෙන අනුමත පංති සීමාව තුළ සිදුකෙරිනි. අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී මෙම විෂයය සංයෝජනය යටතේ තරා කිරීම සිදු නොවන බැවින් පාසල තුළ ද තරා කිරීම සිදු නොකෙරුනු අතර අභිප්‍රේරණ උපාය මාර්ගයක් ලෙස ඉතා ඉහළ Z ලකුණක් ලබා ඇති සිසුන් වෙතොත් ඔවුන්ට හට විදුහල්පති අතින් ප්‍රගති වාර්තාව ලබාදීම සිදු කෙරිනි.

## 6 – 11 වාර විභාග ඇගයීම

සිසුන් තුළ වන අනවශ්‍ය තරඟකාරීත්වය ඉවත් කිරීම තුළින් විභාග පීඩනය අඩු කිරීමත් සිසුන් තුළ සියළු ම විෂයයන් කෙරෙහි ඇති අවධානය ධනාත්මකව ඉහළ නැංවීමත් අරමුණු කොට ගෙන අභිප්‍රේරණ උපාය මාර්ගයක් ලෙස 6 -11 ශ්‍රේණි වල විදුහල්පති විසින් වාර විභාග ඇගයීම වෙනුවෙන් ප්‍රගති වාර්තා ලබාදීම එක් එක් පංතියේ පළමු ස්ථානගත් 5 දෙනාගෙන් විතැන් ව සෑම විෂයයක් සඳහා ම ලකුණු 75ට වඩා වැඩියෙන් ගත් සියලු සිසුන්ට ලබා දෙන පරිදි සිදු කෙරුනි.

## මාර්ගගත අධ්‍යාපනයට නව මාධ්‍යයක්

මාර්ගගත ඉගැන්වීම් සඳහා මාධ්‍යයක් ලෙස ආදි ශිෂ්‍ය සංගමයේ අනුග්‍රහ ඇතිව භාවිත කරන ලද අධික පිරිවැයක් දැරිය යුතු ZOOM මෘදුකාංගය වෙනුවට සෑම සිසුවෙකුට ම වෙනම ලියාපදිංචි ගිණුමක් සහිත පාසල මගින් කිසිදු පිරිවැයක් දැරීමට අවශ්‍ය නොවන අධ්‍යාපනය සඳහා ම නිමැවුනු ඕනෑම වේලාවක් අඛණ්ඩ ව භාවිත කළ හැකි MS Teams මෘදුකාංගය හඳුන්වා දුන් අතර එය සාර්ථක ව භාවිත ද කරන ලදී. ඒ අනුව ඕනෑම අවස්ථාවක මාර්ගගත අධ්‍යාපන කටයුතු සිදු කිරීමේ හැකියාව පාසල සතු වේ. දිවයිනේ ප්‍රථම වතාවට MS Teams මෘදුකාංගය භාවිතයෙන් ඉහළ කණ්ඩායම් සහභාගීත්වයක් සහිත ව අති සාර්ථක ලෙස මාර්ගගත ව දැනුම මිනුම තරගයක් පැවැත්වීමට රිච්මන්ඩ් දැනුම මිනුම සමාජයට හැකිවීම ද විශේෂත්වයකි.

# ක්‍රීඩා සහ විෂයය සමගාමී කටයුතු අංශය

## 117 වන සහ 118 වන රිච්මන්ඩ් - මහින්ද ආදරවන්තයින්ගේ සටන

කොවිඩ් සහ විවිධ පාලනය කළ නොහැකි තත්ත්වයන් මත 2019න් පසු පවත්වා නොතිබි රිච්මන්ඩ් - මහින්ද ආදරවන්තයින්ගේ සටන, 2022 වර්ෂයේ ප්‍රේක්ෂක සහභාගීත්වයෙන් තොරව කිසිදු ආදායමක් නොඉපදවමින් ද 2023 වර්ෂයේ ප්‍රේක්ෂක සහභාගීත්වය සහිතව මෙතෙක් තරග ඉතිහාසයේ වාර්තා වූ වැඩිම ප්‍රවේශපත්‍ර අලෙවියක් සහිතව අති සාර්ථකව ඊට අනුශාංගික වූ සියළු අංගයන් ද සහිතව සාමකාමීව පවත්වා නිමාවට පත්කිරීම ද විශේෂත්වයකි.

## 27 වන රිච්මන්ඩ් - ඇලවීෂියස් මහා රග්බි තරගය

කොවිඩ් සහ විවිධ පාලනය කළ නොහැකි තත්ත්වයන් මත 2019න් පසු පවත්වා නොතිබි රිච්මන්ඩ් - ඇලවීෂියස් රග්බි මහා තරගය 2023 වර්ෂයේ දී ප්‍රේක්ෂක සහභාගීත්වය සහිතව අති සාර්ථකව ඊට අනුශාංගික වූ සියළු අංගයන් ද සහිතව සාමකාමීව පවත්වන ලදී.

## නව ප්‍රාසාංගික අත්දැකීමක් (පොසොන් බැගි ගී සරණිය)

පොසොන් පොහොය නිමිති කොටගෙන රිච්මන්ඩ් විද්‍යාලයීය ශිෂ්‍ය නායක මණ්ඩළ ව්‍යාපෘතියක් ලෙස උසස් පෙළ අංශයේ සියළු ම විෂය ධාරාවන් හදාරන සිසුන්ගේ සහ අවට පාසල්වල ශිෂ්‍ය නායක මණ්ඩළ නියෝජනය කරමින් සම්බන්ධ වූ බැති ගී කණ්ඩායම්වල බැති ගී ගායනයන්ගෙන්, බෞද්ධ නාට්‍යකින් සහ උඩරට සහ සබරගමු නර්තන අංගයන්ගෙන් සමන්විත ව පවත්වන ලද ප්‍රථම පොසොන් බැති ගී සරණිය සියලු ප්‍රේක්ෂකයින්ගේ ඉහළ පැසසුමට ලක් විය. මෙය මෙම වයස් කාණ්ඩයේ දරුවන් සැමට සහභාගිවීමට ඉඩහසර ලද ප්‍රථම ප්‍රාසාංගික අත්දැකීම එය වීම ද සුවිශේෂී කරුණකි.

## යෞවනයට ඉඩක් අන්තර් පංති ක්‍රිකට් තරගය

කොවිඩ් ඇතුළු අනේකවිධ ආර්ථික හා සමාජීය ගැටලු හේතුවෙන් නිවසට සීමාව දැඩි කායික මානසික පීඩනයකට ලක්ව සිටි වයසට අදාළ බොහෝ ක්‍රියාකාරකම් සඳහා නිතැතින්ම සීමා පැනවී තිබූ දරුවන්ට පොත පතේ දැනුම දීමට ප්‍රථම ව නිදහස් චලනයන් සහ හැඟීම් එළි දැක්වීම සඳහා අවස්ථාව උදාකරදීම වඩාත් කාලෝචිත බව හැඟී ගිය හෙයින් යෞවනයට ඉඩක් නමින් 9 ශ්‍රේණියේ සිට ඉහළ දරුවන්ට තම ශ්‍රේණියේ සෙසු පංති අතර සීමිත ඕවර ක්‍රිකට් තරග සංවිධානයට අවස්ථාව උදාකර දුන් අතර ඉතා ඉහළ උද්යෝගයකින් ගුරුවරුන්ගේ මගපෙන්වීම යටතේ දරුවන් සැහැල්ලුවෙන් සතුට අත්විඳිනු නිරීක්ෂණය විය. මේ හරහා සිසුන් නැවත අධ්‍යාපන ක්‍රියාවලියට යොමුගත කිරීම පහසු විය.

**2022 සහ 2023 වර්ෂ ක්‍රීඩා සහ විෂයය සමගාමී අංශ දෙකම සඳහා ජයග්‍රාහී වර්ෂ දෙකක් වන අතර සිසුන්ගේ ජයග්‍රහණ පිළිබඳ විස්තර ඇමුණුමක් ලෙස මෙම ලේඛනය අවසානයේ ඔබගේ දැනුවත්භාවයට ඉදිරිපත් කර ඇත.**

## පාසල් සංවර්ධන සමිති විශේෂ ව්‍යාපෘති

පාසල් සංවර්ධන සමිති විශේෂ ව්‍යාපෘතියක් ලෙස විද්‍යාලයීය ප්‍රමුඛ අවශ්‍යතා දෙකක් වන විද්‍යාලයට බස් රථ 2ක් මිලදී ගැනීම සහ පරිගණක 150ක් මිලදී ගැනීම සඳහා පවත්වන ලද ලොතරැයිය විවිධ අභියෝග මධ්‍යයේ රිච්මන්ඩ් විද්‍යාල ඉතිහාසයේ සිදුකර ඇති ව්‍යාපෘති අතරින් වැඩිම ආදායමක් උපයන ලද ව්‍යාපෘතිය බවට පත්වීමත් විශේෂ වේ. එහි ඉලක්කගත ආදායම වූ රුපියල් මිලියන 42.5ක මුදල ඉපයීමට අපොහොසත්වීම හේතුවෙන් සහ දේශීය වෙළඳපළෙහි ඉලක්ක කරන ලද බස්රථ ලොතරැයි දිනුම් ඇදීම සිදුවන විට නොපැවතීමත් හේතුවෙන් මෙතෙක් එහි ප්‍රතිලාභ විද්‍යාලයට ලබාගැනීමට නොහැකි වුව ද මේ දක්වා එකතුව ඇති රුපියල් මිලියන 10කට අධික ආදායම් මුදල එම කාර්යයන් සඳහාම වෙන්කර ගිණුම්ගතව පවතී.

# කොවිඩ් තත්ත්වය මත තාවකාලික ව නැවතුනු සියලු ක්‍රියාකාරකම් නව මුහුණුවරකින් නැවතත්...

## පාසල් ජන්ම දින සැමරුම

වසර ගණනාවකට නැවතී තිබූ මහා පිරිත් පිංකම සහ සෙසු සර්ව ආගමික අශිර්වාද වැඩසටහන් විවිධ අභියෝග මධ්‍යයේ නැවත ඇරඹීමටත් වඩාත් හරවත් ව සහ අලංකාර සංස්කෘතික අංගයන් ද එක් කොට 2022 සහ 2023 යන වර්ෂ දෙකෙහි ම පැවැත්වීමටත් හැකි විය. දිගු කලක් සිට සිදුකරන ලද පරිදි පිටින් ගෙන්වා අලංකරණය කරන ලද පිරිත් මණ්ඩපයක් යොදාගනු වෙනුවට ඉංජිනේරු තාක්ෂණ අංශයේ මූලිකත්වයෙන් උසස් පෙළ සිසුන්ගේ ශ්‍රම දායකත්වයෙන් සහ නිර්මාණශීලීත්වයෙන් පාසල තුළ ම සකසන ලද අලංකාර පිරිත් මණ්ඩපයයක් යොදා ගැනීම ද අලංකාර කලා අංග රැසකින් සමන්විතව පෙරහැරක් පැවැත්වීම ද සුවිශේෂී වේ.

## නත්තල් (කැරොල්) සැමරුම් සහ රාමසාන් දින සැමරුම්

වසර ගණනාවකට පසු නත්තල් දින සැමරුම් සහ රාමසාන් සැමරුම් අති උත්කර්ෂවත් ලෙස වැඩි පිරිසකගේ සහභාගීත්වයෙන් 2023 දෙසැම්බර් මාසයේ දී පවත්වන ලද අතර පාසලේ බහු සංස්කෘතික පරිසරය සහ ආගමික සහනශීලීත්වය විදහා පාමින් එම සැමරුම් සඳහා ආගම් භේදයකින් තොරව සෑම වයස් කාණ්ඩයක ම සිසුන් ක්‍රියාශීලීව එක්වීම ද සුවිශේෂී කරුණකි.

## බදාදා දින සිසු දක්ෂතා ඇගයීම

සිසුන් විසින් අත්පත් කරගත් ක්‍රීඩා සහ විෂයය සමගාමී ජයග්‍රහණ ඇගයීමේ ඉහත වැඩසටහන 2022 වර්ෂයේ සිට යළි අරඹන ලද අතර එය පවත්වන දිනය බ්‍රහස්පතින්දා දිනට වෙනස් විය.

## විෂය සමගාමී ක්‍රියාකාරකම් වලට අදාළ විවධ දින

එක් එක් සංගම්වලට අදාළව සියලුම දින (DAYS) 2022 වර්ෂයේ සිට යළි පවත්වන ලදී.

## අධ්‍යාපන චාරිකා

සියලු ම පංතිවල අධ්‍යාපන චාරිකා 2022 වර්ෂයේ සිට යළි අරඹන ලද අතර 2023 වර්ෂයේ දී පාසල් ඉතිහාසයේ ප්‍රථම වතාවට 2 ශ්‍රේණියේ සිසුන් සඳහා ද අධ්‍යාපන චාරිකාවක් සංවිධානය විය.

## විවිධ කඳවුරු/සමුළු, විෂයය සමගාමී ක්‍රියාකාරකම් සහ මලල ක්‍රීඩා උත්සවය

බාලදක්ෂ, ප්‍රථමාධාර, ශිෂ්‍යභට, ක්‍රීඩා සහ වෙනත් විෂයය සමගාමී කඳවුරු සියල්ල 2022 වර්ෂයේ සිට යළි අරඹන ලදී. එලෙසම සියළු සංගම්/සමාජ ඔවුන් විසින් මීට පෙර වර්ෂවල පවත්වා තාවකාලිකව නවතන ලද සියළු ක්‍රියාකාරකම් නවතාවයකින් යුතුව යළි අරඹන ලදී. එලෙසම මලල ක්‍රීඩා උත්සවයට අදාළ සියලු ඉසව් පවත්වා සහතික පත්‍ර පිරිනමන ලදී. ක්‍රීඩා උත්සවය පමණක් නොවැළැක්විය හැකි හේතුන් මත නොපැවැත්විණි.

## ළමා දින සහ ගුරු දින සැමරුම්

ළමා දින සැමරුම් සිසුන්ගේ රුචිකත්වය අනුව 2022 වර්ෂයේ දීත් සිසු දක්ෂතා එළි දැක්වෙන ප්‍රසංගයන් ලෙස සහ විවිධ විනෝදජනක ක්‍රියාකාරකම් ලෙස 2023 වර්ෂයේ දී නව මුහුණුවරකිනුත් ක්‍රියාත්මක විය. ගුරු දින සැමරුම් 2022 වර්ෂයේ එතෙක් පවත්වාගෙන ආ පරිදිත් 2023 වර්ෂයේ දී සෙසු සිසුන් ද හා එක්ව එකම වැඩපිළිවෙළක් යටතේත් ශිෂ්‍ය නායක මඩුල්ල විසින් සිදු කරන ලදී.

# ශිෂ්‍ය නායක මණ්ඩලය

ශිෂ්‍ය නායක මඩුල්ල ප්‍රධාන ශිෂ්‍ය නායක, ලේකම්, භාණ්ඩාගාරික, උප ලේකම් සහ උප භාණ්ඩාගාරික යන ප්‍රධාන තනතුරු 5කින් ද, දෙවන වසර ශිෂ්‍ය නායකයින්, පළමු වසර ශිෂ්‍ය නායකයින්, උප ශිෂ්‍ය නායකයින් සහ කණිෂ්ඨ ශිෂ්‍ය නායකයින්ගෙන් සැදුම්ලත් විදුහල්පති ශිෂ්‍ය නායක භාර ආචාර්යයවරයා ලෙස කටයුතු කරන පාසලේ ප්‍රධානත ම ශිෂ්‍ය ව්‍යුහය වේ. ප්‍රධාන ශිෂ්‍ය නායක සහ සෙසු ප්‍රධාන නිලයන්ට පත් කිරීම සඳහා පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණය සඳහා නව මුහුණුවරක් හඳුන්වාදීම 2022 වර්ෂයේ දී සිදුවිය.

ඒ අනුව දෙවන වසර ශිෂ්‍ය නායකයින් සියළුදෙනා ම ශ්‍රවණය (Listening), කියවීම (Reading), ලේඛනය (Writing) සහ කථනය (Speaking) යන ප්‍රධාන සන්නිවේදන කුසලතා හතර මැන බැලෙන පරීක්ෂණයන්ට සහ ආකල්ප, නායකත්වය සහ ශිෂ්‍ය නායක මණ්ඩලය සම්බන්ධයෙන් ඇති දැනුම පිරික්සන සිද්ධි අධ්‍යයනයකින් ද සමන්විත ඉංග්‍රීසි භාෂාවෙන් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයකටත් භාජනය කෙරේ. සම්මුඛ පරීක්ෂණය සම්පූර්ණයෙන්ම රූ ගත (Virtually recorded) කෙරේ. පාසලේ ප්‍රධාන ශිෂ්‍ය නායක සහ ලේකම්/භාණ්ඩාගාරික යන ප්‍රධාන නිලයන් ඒ සඳහා තාක්ෂණික සහාය සැපයිය යුතු අතර ශිෂ්‍ය නායක කටයුතු භාර ආචාර්යය සහ පාසලේ නියමුවාණන් ලෙස විදුහල්පති සම්මුඛ පරීක්ෂණය මෙහෙයවනු ලබයි. එක් අයකු සඳහා උපරිම ලෙස මිනිත්තු 40ක පමණ කාලයක් වෙන් කෙරේ. සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල සහ තත්කාලීන ප්‍රධාන ශිෂ්‍ය නායකයා විසින් ලබා දෙන නිර්දේශ ද සැලකිල්ලට ගෙන විදුහල්පති විසින් තනතුරු සඳහා සුදුස්සන් තෝරා ගැනේ. සම්මුඛ පරීක්ෂණයට සහභාගිවන්නන් ට අවශ්‍ය වෙතොත් යොමු කරන ප්‍රශ්න පිළිබඳ ව සිංහල භාෂාවෙන් නැවත පැහැදිලි කරගැනීමට මෙන් ම පිළිතුරු දීමට ද අවකාශ සැලසෙන අතර අදහස් දක්වන මාධ්‍යය තේරීම සඳහා කිසිදු බලපෑමක් සිදු නොකරයි. එසේවුව ද ශ්‍රවණ කුසලතාව මැන බැලෙන පරීක්ෂණය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් සිදු කෙරේ.

ශිෂ්‍ය නායක මණ්ඩලයේ දෙවන වසර සිසුන් අ.පො.ස (උ.පෙළ) විභාගය අවසන්ව එක් වසරක් පාසලට සේවය කිරීමට කැප වූ පිරිසකි. එබැවින් වැඩලෝකයේ ප්‍රායෝගික භාවිතාවට වැදගත් වන විදුහල්පති කාර්යාලය මගින් ඉටු කරනු ලබන රහස්‍ය නොවන කාර්යයන් සඳහා ඔවුන් යොදවා ගැනීම ද සිදු වේ. මෙමගින් ඔවුන්ට නව තාක්ෂණික උපාය මාර්ග භාවිතය, කළමනාකරණ මූලික සිද්ධාන්ත වන සැලසුම්කරණය, සංවිධානය, මෙහෙයවීම සහ පාලනයට අදාළ ප්‍රායෝගික භාවිතය ලබා ගැනීමේ අවකාශ සලසා ඇත. තව ද මෙම ශිෂ්‍ය නායකයින් හට ඒකල හෝ සමූහ ව්‍යාපෘති සිදු කිරීම නියම කර ඇති අකර ඒ හරහා සිය නායකත්ව හැකියාවන් සංවර්ධනය කරගැනීමට අවස්ථාව සලසා ඇත. ඒ අතර උප ශිෂ්‍ය නායකයින් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කෙරෙන අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘති ප්‍රමුඛ වේ.

දෙවන වසර ශිෂ්‍ය නායකයින් ශිෂ්‍ය නායක මණ්ඩලයෙන් ඉසිඹුලැමට ආසන්න දිනවල දී ඔවුන්ට සිය සම්මුඛ පරීක්ෂණ වීඩියෝ නැරඹීමට අවස්ථාව ඇති අතර ඒ අනුව වසරක කාලයක් තුළ විද්‍යාලයීය ඉහළ කළමනාකාරීත්වය සමග ඉතා සමීපව කටයුතු කිරීම මගින් ඔවුන් ලබා ඇති ප්‍රගතිය ද වැඩලෝකයේ දී සම්බන්ධවන සම්මුඛ පරීක්ෂණ සඳහා තම අඩුපාඩු සකස් කර ගත යුතු ආකාරය පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට ඔවුනට අවකාශ සැලසේ.

## සියලු ශිෂ්‍ය නායකයින් එක් නායකත්වයක් යටතට

2023 තෙක් පැවතගෙන ආ ක්‍රමය වූයේ විදුහල්පති විසින් නම් කරන ලද ආචාර්යයවරයකු යටතේ කනිෂ්ඨ ශිෂ්‍ය නායකයින් සිය රාජකාරී ඉටු කිරීම යි. 2023 වර්ෂයේ දී එලෙස නම්කරන ලද ගුරු මහත්මා ස්ථාන මාරු ලැබීම සිදුවිය. ඉන් අනතුරු ව 10 සහ 11 ශ්‍රේණිවල කණිෂ්ඨ ශිෂ්‍ය නායකයින් ශිෂ්‍ය නායක මණ්ඩලය යටතට ගැනිනි.

2023 වර්ෂයේ සිට ඉහළ කළමනාකාරීකත්වයෙන් සැදුම්ලත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් අ.පො.ස (සා.පෙළ) විභාගය නිම ව ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටින සිසුන් අතරින් මගින් නායකත්වයට සුදුසු බවට නිර්දේශ කරන ලද සිසුන් කිහිපදෙනෙකු ද 12 ශ්‍රේණියේ සිසුන් අතරින් නායකත්වයට සුදුසු බවට නිර්දේශ කරන ලද සිසුන් කිහිපදෙනෙකු ද පරිවාසික උප ශිෂ්‍ය නායකයින් ලෙස බඳවා ගැනීමත් ඔවුන් පරිවාස කාලයකට ලක් කිරීමත් පරිවාස කාලය තුළ අංශ භාර ගුරු මහත්ම මහත්මීන්ගේ නිරීක්ෂණ ද සැලකිල්ලට ගෙන ඒ අතරින් වැඩ සහ හැසිරීම ප්‍රශස්ථ මට්ටමක වූ සිසුන් උප ශිෂ්‍ය නායකයින් ලෙස ස්ථිරව ම බඳවා ගැනීමත් සිදු විය.

***